**නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ (නි.ව.බ) ව්‍යාපෘතිය (ඒ සංරචකය) - 2013**

**----------------------------------------------------------------------------------------------------**

නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ (නි.ව.බ) ව්‍යාපෘතියේ (ඒ සංරචකය) 2013 ජුනි 30 දිනෙන් අවසන් මාස 6 ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය(ශ්‍රීලංර) සහ වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) ලෙස හැඳින්වෙන ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (ජාසජබැ) අතර 2003 මාර්තු 26 දින එළඹී අංක එස්එල් - පී77 දරණ ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4(7) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බලගැන්වීමේ (නි.ව.බ) ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ වයඹ, උතුරු මැද හා මධ්‍යම පළාත්වල වාරිමාර්ග පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ ආදායම් උත්පාදන කාර්යයන් ඇති කිරීම ආදිය මඟින් දිළිඳුකම අඩුකිරීම, ගොවීන්ගේ ඵලදායීතාවය වැඩි කිරීම, හා තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,040 ක් වන අතර එයින් රු.මිලියන 2,509 ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සහයෝගිතාවය පිළිබඳ ජපන් බැංකුව (ජාසජබැ) එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2005 ඔක්තෝබර් 06 දින ආරම්භ කරන ලද අතර 2013 මැයි 22 දින නිම කරන ලදි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

**---------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා

ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක සහ අවසන් ශේෂ, එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 ජුනි 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ඉකුත් වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව.

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද වන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 ජුනි 30 දිනෙන් අවසන් මාස 06 ක කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 ජුනි 30 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 ජුනි 30 දිනෙන් අවසන් මාස 06 ක කාල පරිච්ඡේදය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම්, හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 ජුනි 30 දිනට ශේෂය එදිනට

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල කටයුතු කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

----------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

---------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.119,694,748 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම රු.584,292,445 ක් විය. සමාලෝචිත මාස 6 ක කාලපරිච්ඡේදය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 ජුනි 30 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | 2013 ජුනි 30 දිනෙන් අවසන් මාස 6 ක කාල පරිච්ඡේදය සඳහා වියදම | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2013 ජුනි 30 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 2013 | 2012 | |
| ස්ථාවර වත්කම් | 24,880,500 | 18,800,000 | 436,373,608 |
| මෝටර් වාහන | 3,604,220 | - | 105,760,919 |
| කෙරීගෙන යන වැඩ | - | 220,374,486 | - |
| පුහුණුව සහ ධාරිතා වර්ධනය | - | 18,295,560 | 430,440,316 |
| උපදේශක සේවා | - | 10,605,290 | 978,498,884 |
| සිවිල් වැඩ, මිනුම් සහ ඉදිකිරීම් | 91,210,028 | 316,217,109 | 4,471,352,910 |
| **එකතුව** | **119,694,748** | **584,292,445** | **6,422,426,637** |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සහ 2013 ජුනි 30 දිනට ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 වර්ෂය | |
|---|---|---|
| | ජපන් යෙන් | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 15,159,446 | 22,434,464 |
| ඌන පූරණයන් | 63,566,942 | 85,407,065 |

| | | |
|---|---|---|
| විදේශ විනිමය පාඩුව | - | (3,847,680) |
| | --------------- | ---------------- |
| | 78,726,388 | 103,993,849 |
| අඩුකළා: | | |
| කාලපරිච්ඡේදය තුළ ආපසු ගැනීම් | 77,878,765 | 102,880,496 |
| | ---------------- | ----------------- |
| 2013 ජුනි 30 දිනට ශේෂය | 847,623 | 1,113,353 |
| | ========= | ========== |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රු.14,512 ක් වූ දුරකථන බිල්පත්වලට අදාළව 2013 ජුනි 30 දිනට ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන ගිණුම් ගත කර නොතිබුණි.

### 5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ආයෝජන කටයුතුවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.95,975,528 කි. කෙසේවෙතත් , එය රු.59,093,227 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. එබැවින් ආයෝජන කටයුතුවලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ රු.36,882,301 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද රු.119,694,748 ක් වූ ආයෝජන පිරිවැය, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ රු.95,975,528 ක ශේෂය සමඟ නොසැසඳුනි.

(ආ) සාවද්‍ය ගිණුම්කරණ පරිචයන් හේතුකොට ගෙන රු.230,812,254 ක් වූ ශේෂයන්ගේ එකතුව වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ආයෝජන පිරිවැය ප්‍රකාශයේ දැක්වුණු ශේෂය සමඟ එකඟ නොවුණි.

### 5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් (ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යාලය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - අනුරාධපුරය) | 484,877,148 | කාලපරිච්ඡේදය අවසානයට සමීක්ෂණ මණ්ඩල වාර්තා, බෙදාහල වත්කම් සඳහා ලැබීම් ඇණවුම් (පොදු 219) |
| ව්‍යාපෘතිය සඳහා පොත් පිංච 1000 ක් නිර්මාණය කිරීම හා මුද්‍රණය කිරීම | 192,500 | තොග සහතික සහ නිකුත් ඇණවුම් (පොදු 141) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම (ජෙනරේටරයක් සහ ජල බවුසර් 06 ක්) | 25,132,500 | මුල් ගෙවීම් වවුචර් |
| | ----------------- | |
| | 510,202,148 | |
| | ========== | |

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 ජූනි 30 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ලේඛනයේ වෙන් කරන ලද මුදල | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ උපයෝජනය කරන ලද මුදල | 2013 ජූනි 30 දිනට උපයෝජනය කරන ලද මුදල |
|---|---|---|---|---|---|
| | ජපන් යෙන් | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ජජාසනි | 2,785 | 2,509 | - | 102 | 5,625 |
| ශ්‍රීලංර | 2,809 | 2,531 | - | 17 | 797 |
| එකතුව | 5,594 | 5,040 | - | 119 | 6,422 |

2013 වර්ෂය සඳහා වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ලේඛනයේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී රු.78,000,000 ක ප්‍රතිපාදනයක් වෙනත් වැය සම්මතයකින් ව්‍යාපෘතියට මාරු කර තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී දරන ලද වියදම රු.119,694,748 ක් විය. ඒ අනුව එකතුව රු.41,694,748 ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

## 6.2 ව්‍යාපෘතියේ භෞතික කාර්යය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය යටතේ විශාල පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම 9 ක්, මධ්‍ය පරිමාණ වාරි මාර්ග යෝජනා ක්‍රම 09 ක් සහ සුළු පරිමාණ වාරිමාර්ග යෝජනා 80 ක් නිම කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී රු.19,087,575 ක් සිවිල් වැඩ වෙනුවෙන් වැය කර තිබූ නමුත් සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වාර්ෂික වැඩ සැලැස්මක් සහ මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තා නොතිබීම හේතු කොට ගෙන සිදු කරන ලද සිවිල් වැඩ විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ආ) ව්‍යාපෘති ප්‍රදේශවල ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය 2008 අගෝස්තු 05 දින රජරට සංවර්ධන බැංකුව හා වයඹ සංවර්ධන බැංකුව සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ව්‍යාපෘති ප්‍රදේශයේ ග්‍රාමීය ජනතාවගේ ආදායම් ඉපැයීමේ කාර්යයන්වලට සහ ගොවි සංවිධානවලට සහය දීමයි. ණය වැඩසටහන් ගිවිසුමට අනුව මෙම කාර්යය සඳහා රු.82,000,000 ක් වෙන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, වයඹ සංවර්ධන බැංකුව ප්‍රදේශයේ ඇති එහි ශාඛා 6 ක් මඟින් රු.80,585,000 ක වටිනා ණය මුදල් අනුමත කර තිබුණි. එයින් රු.21,703,120 ක් පමණක් ආපසු අයකරගෙන තිබුණි.

(ii) රජරට සංවර්ධන බැංකුවට අදාලව 2013 ජුනි 30 දිනට අදාල තොරතුරු විගණනයට සපයා නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට රු.3,508,980 ක් වටිනා ණය වාරික හිඟව පැවතුණ අතර අදාළ බැංකු විසින් රු.2,793,761 ක ශේෂය අයකර ගැනීම සඳහා ණය ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට එරෙහිව නෛතික පියවර ගෙන නොතිබුණි.

## 6.3 මතභේදයට තුඩුදෙන කරුණු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුරාධපුර ව්‍යාපෘති කාර්යාලය රු.1,350,000 ක වාර්ෂික කුලියක් යටතේ පුද්ගලික පාර්ශවයකට අයත් ගොඩනැගිල්ලක 2011 ඔක්තෝබර් සිට 2013 මාර්තු දක්වා පවත්වාගෙන යන ලදී. කෙසේ වෙතත්, 2009 වර්ෂයේදී නිකුත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව මාසික කුලිය රු.37,500 කට තීරණය කර තිබුණි. ඒ අනුව මාස 18 ක් සඳහා රු.675,000 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි. කුලී ගිවිසුම දීර්ඝ කිරීමකින් තොරව 2013 ජුනි 30 දක්වා ව්‍යාපෘති කාර්යාලය එහි අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

(ආ) ව්‍යාපෘතිය විසින් රු.2,352,000 ක් වටිනා ජෙනරේටරයක් (එකතු කළ අගය මත බදු රු.252,000 ක්ද සහිතව) සහ රු.22,780,500 ක් වටිනා ජල බවුසර් 6 ක් ව්‍යාපෘති කාල සීමාව අවසානයේදී ප්‍රසම්පාදනය කරන ලදී. කෙසේ වෙතත් ව්‍යාපෘතිය අවසාන අදියරයේදී මෙම ප්‍රසම්පාදනයන් කිරීම විගණනයේදී සාධාරණියකරණය කිරීමට හේතු පැහැදිලි කර නොතිබුණි. තවද එම වත්කම් මහවැලි අධිකාරියේ " නිරාවිය " ගොවිපොළ වෙත භාරදී තිබූ බවද නිරීක්ෂණය විය. ඊට අමතරව රු.8,513,972 ක පිරිවැය දරමින් කුකුල්, තාරා ආදී සතුන් ඇති කරන මඩු 05 ක් 2012 වර්ෂයේදී ඉදිකරන ලද අතර සමාලෝචිත වර්ෂය තුලදී " නිරාවිය " ගොවිපළේ කිරිපට්ටි කර්මාන්ත ශාලාව නවීකරණය සඳහා රු.1,973,876 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් නිරාවිය ගොවිපොළ කාර්යයන් මෙම ව්‍යාපෘතිය යටතට ඇතුළත්ව නොතිබුණි.

(ඇ) සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී රාජාංගනය ආදර්ශ ගොවිපොළේ සහ නාච්චදූව ස්වභාවික උද්‍යානයේ සමහර ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීම් සඳහා රු.4,233,702 ක මුදලක් වැය කර තිබූ නමුත් ඒවා ව්‍යාපෘතිය හා සම්බන්ධ කාර්යයන් නොවීය.

## 6.4 ව්‍යාපෘතිය ඇවර කිරීමේ කටයුතු

---------------------------------

ව්‍යාපෘතිය ඇවර කිරීමේ සැලැස්ම 2014 අගෝස්තු 31 දක්වා පිළියෙල කර නොතිබුණි. කෙසේ වෙතත්, 2013 ජූලි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ව්‍යාපෘතිය රු.25,420,885 ක වියදමක් දරා තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය නිම කිරීමේදී රු.484,877,148 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ, රසායනාගාර සහ මිනුම් උපකරණ ආදී වත්කම් විවිධ රාජ්‍ය

නියෝජිතායතනවලට භාරදී තිබුණි. කෙසේ වෙතත් මෙකී වත්කම් එම රාජ්‍ය ආයතන විසින් භාරගත් බවට තහවුරු කෙරෙන වත්කම් භාරගැනීමේ ලැයිස්තු, වාහන ලියාපදිංචි කිරීමේ පොත් ආදී ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, මෝටර් වාහන 23 ක් රාජ්‍ය නියෝජිතායතන අතර බෙදා හැර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද ලැයිස්තුවෙහි එකී වාහන අන්තර්ගතව නොතිබුණි.

(ඇ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රඹෑව වැඩපොළ වෙත යතුරු පැදි 46 ක් භාරදී ඇති නමුත් මෙම යතුරු පැදි භාරදීමට හේතු පැහැදිලි නොකරන ලදී.

(ඈ) ව්‍යාපෘතිය විසින් සපයනු ලැබූ බෙදාහැරීමේ ලැයිස්තුවල වටිනාකම් නොදැක්වුණු හෙයින් රාජ්‍ය නියෝජිතායතන අතර බෙදාහරින ලද ස්ථාවර වත්කම්, මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමට නොහැකි විය.

(ඉ) 2013 ජූනි 30 දිනට ව්‍යාපෘති කටයුතු නිමකර තිබූ නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් බැංකු ගිණුම් 7 ක් වසා දමා නොතිබුණි.

(ඊ) ව්‍යාපෘති කාර්යයන් යටතට නොගැනෙන මහවැලි අධිකාරියේ නිරාවිය ගොවිපොළට පිළිවෙලින් රු.7,300,000 ක සහ රු.15,675,310 ක පිරිවැයකට ෆුසෝ කැබ් රථයක් සහ ශීතකරණය සහිත වැසියක් හා කිරි නිෂ්පාදන ඒකකයක් මිලදී ගෙන තිබුණි.

## 7. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ඇවර කිරීමේ ක්‍රියාවලිය
(ඇ) ණය වැඩසටහන පාලනය
(ඈ) ස්ථාවර වත්කම් බෙදාහැරීම